සැබැවින්ම ඔබ අතරින් වඩාත් උතුම් අය වනුයේ ඔබ අතර සිටින ගතිගුණවලින් වඩාත් යහපත් තැනැත්තාය

අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් වාර්තා කරන ලදී: නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් අසභ්ය වචන කතා කරන්නෙකු හෝ අසභ්ය ක්රියා
සිදු කරන්නෙකු ලෙස සිටියේ නැත. සැබැවින්ම එතුමාණෝ මෙසේ පවසමින් සිටියහ:
"සැබැවින්ම ඔබ අතරින් වඩාත් උතුම් අය වනුයේ ඔබ අතර සිටින ගතිගුණවලින් වඩාත් යහපත් තැනැත්තාය."
[صحيح] [متفق عليه]

අවිනීත වචන කතා කිරීම හෝ අවිනීත ක්රියාවන්හි නිරතවීම හෝ නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ ගුණාංග අතරින් නොවීය. එතුමාණෝ එවැන්නක් නොසිතු අතර එවැන්නක් සඳහා අධීෂ්ඨාන කර ගත්තේ ද නැත. එතුමාණෝ මහඟ ගුණ යහපත් බවින් යුක්ත වූහ. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ ද පවසමින් සිටියහ: සැබැවින්ම ඔබ අතරින් අල්ලාහ් අබියස ගතිගුණවලින් වඩාත් උතුම් තැනැත්තා වනුයේ යහ ක්රියා සිදු කරන, සිනහමුසු මුහුණින් හමු වන, හිංසාවෙන් වැළකී ඒවා විඳ දරාගන්නා හා මිනිසුන් සමග අලංකාර අයුරින් ආශ්රය කරන තැනැත්තාය.

https://sunnah.global/hadeeth/si/show/5803